සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – Second Term Test – July 2019
දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 9 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## Christianity
ක්‍රිස්තියානි ධර්මය

Name :- .................................................... Grade : -................ Index number:-....................

**I කොටස**

❖ **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. දෙවියන් වහන්සේගේ නාමය නිසා ප්‍රතික්ෂේප කරනු ලබන අය
   (i) ගල් ගසා මරනු ලැබේ (ii) සමාජයෙන් කොන් කරනු ලැබේ
   (iii) උසස් කරනු ලැබේ. (iv) ගැරහීමට ලක් කරනු ලැබේ.

2. ධර්මිෂ්ඨයන් සම්බන්ධයෙන් සත්‍යයක් නොවනුයේ මින් කුමන කියමනද?
   (i) ආශිර්වාද ගලා එයි. (ii) සුව සම්පත ලැබේ.
   (iii) බොහෝ පීඩාවන්ට ගොදුරු වේ. (iv) සහනය ලැබේ.

3. එදා සමාජයෙන් ප්‍රතික්ෂේපව සිටි පිරිසකි.
   (i) කුඩා දරුවන් (ii) වැන්දඹුවන් (iii) කුෂ්ඨරෝගීන් (iv) අයකැමියන්

4. කිතුනු සභාව වෙනුවෙන් තම ජීවිතය පළමුවෙන් පුජා කල වේද සාක්ෂිකයා
   (i) සාවුල් (ii) ස්තෙපන් (iii) යාකොබ් (iv) පේදුරු

5. සාවුල්ට ජේසුස්වහන්සේ මුණ ගැසුනේ,
   (i) මිසරයට යන අතරදිය (ii) ජේරිකෝවට යන අතරදීය
   (iii) දමස්කයට යන අතරදීය (iv) ඊජිප්තුවට යන අතර දීය

6. ශුද්ධාත්ම රැකවරණය ලැබෙන විට
   (i) භායානක ලෙඩ රෝග වලට ගොදුරු වේ.
   (ii) ජීවිත තර්ජනයන්ට ගොදුරු වේ.
   (iii) නොයෙක් අපහස වලට ගොදුරු වේ.
   (iv) සැම දෙයටම මුහුණදීමට දිරිය හා සවිය ලැබේ.

7. බීමත්කම නිසා වැලදිය හැකි රෝගයකි.
   (i) පිළිකාව (ii) නියුමෝනියාව (iii) සිරෝසීස් (iv) ක්ෂය රෝගය

8. ක්ෂණික ලාභ අපේක්ෂා කිරීම නිසා පිරිහීම ඇති වන්නේ මින් කුමන පුරුද්ද නිසාද?
   (i) වංචාව (ii) හොරකම (iii) සූදුව (iv) බොරුකීම

9. නව තාක්ෂණ දියුණුවේ පුළුල් මංපෙත් විවර වී ඇත්තේ කුමන තාක්ෂණය නිසාද?
   (i) ජංගම දුරකථනය (ii) අන්තර්ජාලය
   (iii) පරිගණකය (iv) පුවත්පත්

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

10. ''ශුද්ධාත්මයාණන් වහන්සේගේ මාළිගාව'' වශයෙන් සඳහන් කරන්නේ,
   (i) අපගේ ප්‍රඥාවයි (ii) අපගේ ශරීරයයි
   (iii) අපගේ හැකියවයි (iv) අපගේ තලෙන්තයි

11. පවුල් ජීවිතය සම්බන්ධයෙන් ඇති දේව නියමයන් නොවන්නේ,
   (i) ජීවිතවල සුරක්ෂිත බවයි. (ii) යහපත් පවුල් පසුබිමයි.
   (iii) කාම මිත්‍යාචාරයයි. (iv) දරුවන්ගේ යහපත ක්‍රියා කිරීමයි.

12. ''සමිඳාණන් වහන්සේ අභිෂේක ලත් තැනැත්තා'' වශයෙන් හැඳින් වූයේ,
   (i) ස්තේපන් (ii) සාවුල් (iii) දාවිත් (iv) ජොනත්

13. දාවිත් සම්බන්ධයෙන් අසත්‍ය වූ කියමන කුමක් ද?
   (i) දැහැමි ජීවිතයක් ගත කළේය.
   (ii) අන්සතු වස්තුව පැහැර ගත්තේය.
   (iii) කමාව ලබා දුන්නේය.
   (iv) නිවැරදි දේ කෙරෙහි සිත යොමු කලේය.

14. ස්වාමින්වහන්සේගේ යාච්ඤාවේ දී කොන්දේසියක් සහිතව කල යුතු ඉල්ලීම
   (i) අපගේ දවස්පතා ආහාරයට ලබා දීම.
   (ii) අපගේ වරදට කමාව ඉල්ලීම.
   (iii) පරීක්ෂාවට නොපමුණුවා නපුරාගෙන් මීදීම.
   (iv) උන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන ලෙස ඉල්ලීම.

15. කානා නුවර සරණ මංගල්‍යය පිළිබඳව සඳහන් කරන ශුභ ආරංචි පොත වන්නේ,
   (i) ශු. මතෙව්ය (ii) ශු. මාර්ක්ය. (iii) ශු. ලූක්ය. (iv) ශු. ජොහාන්ය

16. ජේසුස් වහන්සේ මිනිසුන්ගේ ශාරීරික අවශ්‍යතා අවබෝධ කරගෙන ක්‍රියා කල අවස්ථාවකි.
   (i) වතුර වයින් කිරීම. (ii) භාරදාහසකට කන්ට දීම.
   (iii) අංශභාග රෝගියා සුව කිරීම. (iv) යක්ෂ ආත්ම දුරු කිරීම.

17. හාස්කම් අත්දැකීමට නම් අප තුළ තිබිය යුතු ගුණාංගය නම්
   (i) කීකරුකම (ii) බලාපොරොත්තුව
   (iii) ඇදහිල්ල (iv) ඥාණය

18. ''මිනිසා සබත උදෙසා නොව සබත මිනිසා උදෙසාය'' යන කියමන තහවුරු කිරීමට ජේසුස්වහන්සේ කල ආශ්චර්යමත් ක්‍රියාව,
   (i) කොර මිනිසා සුවපත් කිරීම. (ii) අත පණ නැති මිනිසා සුවපත් කිරීම.
   (iii) අන්ධ මිනිසා සුවපත් කිරීම. (iv) මහලේ රෝගීයා සුව කිරීම.

19. මියගිය තබීතා නම් කාන්තාවට නැවත ජීවය ලබා දුන්නේ,
   (i) පිලිප්තුමාය (ii) පේදුරුතුමාය (iii) මතෙව්තුමාය (iv) යාකොබ්තුමාය

20. පන්දහසකට කෑම දීමේ දී අපට හමුවන ප්‍රේරිතයා
   (i) 10කි. (ii) 12කි. (iii) 7කි. (iv) 15කි.

(2 × 20 = 40)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**

1. (i) සමිඳුන්ගෙන් ලැබෙන දීමනාවක් ලෙස කිතුනුවන් අදහස් කරන්නේ කුමක්ද?
   (ii) සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමග පෙරමුණ ගෙන ඇති සන්නිවේදන මාධ්‍ය කුමක්ද?
   (iii) මිනිසාට ඇති දැනුම හා ඥාණය ගැන සඳහන් වන බයිබල් පොත කුමක්ද?
   (iv) කිතුනු සභාවේ ප්‍රථම වේද සාක්ෂිකයා ලෙස දිවි පිදුවේ කවුද?
   (v) පාවුල්තුමා ශුද්ධාත්ම දිරිය ලැබූ බවට ඇති ප්‍රථම සාක්ෂිය කුමක් ද?
   (vi) තමාට ඇති ප්‍රශ්න සංකීර්ණ වීමට බලපාන මිනිසා ගොදුරු විය හැකි මාංශික තෘෂ්ණාව කුමක්ද?
   (vii) ශුද්ධාත්මයාණන්ගෙන් දිරිය ලැබූ පේදුරුතුමා ජොප්පාවේදී කල බලවත් ක්‍රියාව කුමක්ද?
   (viii) ජේසුස්වහන්සේ සබත් දින රෝගීන් සුව කරමින් අනුගමනය කල පිළිවෙත කුමක්දැ
   (ix) ජේසුස්වහන්සේ කානා නුවර සිදුකල හාස්කම් 2ක් ලියන්න.
   (x) අප යාච්ඤා කරන අවස්ථා 2ක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

2. නව තාක්ෂණයේ දියුණුව සමඟ සන්නිවේදනයේ නව පෙරලියක් ඇති විය.
   (i) නව තාක්ෂණයේ ඉතා පුළුල් වූ මංපෙතක් විවර කල සන්නිවේදන මාධ්‍ය කුමක්ද? (ලකුණු 2)
   (ii) ඔබ නම් කල සන්නිවේදන මාධ්‍යයෙන් මිනිසට ඇති පහසුකම් 3ක් ලියන්න. (ලකුණු 3)
   (iii) මෙම සන්නිවේදන මාධය නිසා මිනිසා මුහුණ දිය හැකි අයහපත් දේවල් 5ක් ලියන්න. (ලකුණු 5)

3. ශුද්ධාත්මදානය ලැබූ ප්‍රේරිතයන්
   (i) ප්‍රේරිතයන්ට ශුද්ධාත්මය දානය ලැබුනේ කවදා ද? (ලකුණු 2)
   (ii) ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වූ ප්‍රේරිතවරු ක්‍රියා කළේ කෙසේද? (ලකුණු 3)
   (iii) මෙලෙස ක්‍රිස්තුස් වහන්සේ තුළ බලයට ලබන අප ක්‍රියා කල යුත්තේ කෙසේද? (ලකුණු 5)

4. සබත් දිනය ජුදෙව්වන්ට වැදගත් දිනයකි.
   (i) ජේසුස්වහන්සේ සබත් දින කල සුව කිරීම කුමක්ද? (ලකුණු 2)
   (ii) උන්වහන්සේ සුව කිරීම කල අයුරු කෙටියෙන් ලියන්න. (ලකුණු 3)
   (iii) අපද මේ ආකාරයට සමාජය තුළ අවශ්‍යතා ඇති අය ගැන ක්‍රියා කරන්නේ කෙසේද? (ලකුණු 5)

5. දේවපියා නිර්මාණය කල මනහර ලොව
   (i) දේව මැවිල්ලේ පාලනය භාර දුන්නේ කාටද? (ලකුණු 2)
   (ii) දේවපියා මිනිසාට ලබා දුන් ආශිර්වාද 3ක් ලියන්න. (ලකුණු 3)
   (iii) දේව මැවිල්ල ගැන මිනිසාට ඇති වගකීම් 5ක් ලියන්න. (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

6. බීමත්කම මාංශික තෘෂ්ණාවකි.

(i) මේ හැර ඔබ දන්නා මාංශික තෘෂ්ණා 2ක් ලියන්න. (ලකුණු 2)

(ii) බීමත්කම නිසා සිදුවෙන හානි 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) ඔබ සඳහන් කළ මාංශික තෘෂ්ණා වලින් වැලකී සිටීම සඳහා කිතුනු දරුවෙකු ලෙස ඔබ ගන්නා පියවර කීපයක් ලියන්න. (ලකුණු 5)